පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
**Police Media Division**

තැ.පෙ. අංකය
த.பெ.இ
P.O. Box No 517

ෆැක්ස්
தொலை நகல்
Fax 011-2329500

දුරකථනය
தொலைபேசி
Telephone 011-2384024
011-2395605

වෙබ් ලිපිනය
இணைய தளம்
Web Site www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E mail dir.media@police.lk

මගේ අංකය
எனது இல
My No 1019 / 2022

ඔබේ අංකය
உமது இல
Your No

දිනය
திகதி
Date 2022.07.14
පැය 0720

# මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**විරෝධතාකරුවන්ගේ පහරදීම නිසා පොලිස් කොස්තාපල්වරයකු සහ යුධ හමුදා සෙබළෙකු තුවාල ලැබීම හා ඔහු සතුව තිබූ ටී 56 වර්ගයේ ගිනි අවියක් පැහැර ගැනිම.**

2022.07.13 වන දින බත්තරමුල්ල පොල්දූව හන්දිය ප්‍රදේශයේ පැවැත් වූ විරෝධතාවයක් පාලනය කිරීමට යාමේදී පොලිස් නිලධාරියකු හා යුධ හමුදා සොල්දාදුවෙකු තුවාල ලබා ඇත.

විරෝධතාකරුවන් පහරදීම නිසා බරපතල තුවාල ලැබූ මෙම පොලිස් කොස්තාපල්වරයා කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයට අනුයුක්තව සේවය කරනු ලබන අතර මොහු මේ වන විට රෝහල් ගතව ප්‍රතිකාර ලබයි.

යුධ හමුදා සෙබළා ද විරෝධතාකරුවන්ගේ පහරදීම නිසා තුවාල ලබා ඇති අතර, ඔහු වැල්ලවාය ප්‍රදේශයේ කඳවුරකට අනුක්තව සිටින අතර මොහු මේ වන විට රෝහල් ගතව ප්‍රතිකාර ලබයි. **පහර දෙන අවස්ථාවේ මෙම සෙබළා භාරයේ තිබූ ටී 56 වර්ගයේ ගිනි අවිය හා එහි ජීව උණ්ඩ 60 ක් අඩංගු පතරොම් ගැබ් 02 ක් විරෝධතාකරුවන් විසින් පැහැර ගත් බවට බොරැල්ල පොලිස් ස්ථානය වෙත පැමිණිලි කර ඇත.** ගිනි අවිය සොයාගැනිම සඳහා ඉදිරි විමර්ශන කටයුතු වැලිකඩ හා බොරැල්ල පොලිස්ථාන මඟින් සිදු කරනු ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**